සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College
Kandana
2025.01

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | කාලය / காலம் / Time: පැය 2 |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

## I කොටස

01. බෞද්ධ සාහිත්‍යයේ "රාහුල මාතා" නමින් ප්‍රසිද්ධියට පත් වූ කාන්තාව වූයේ,
(1) මහාමායා දේවියයි. (2) යසෝදරා දේවියයි.
(3) සුජාතා සිටු දේවියයි. (4) ප්‍රජාපතී ගෝතමී දේවියයි.

02. බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය දී පැවිදිව රහත් වූ අන්තිම භික්ෂූන් වහන්සේ කවුරුන් ද?
(1) ධර්මාරාම තෙරුන් ය. (2) ස්වර්ණකාර තෙරුන් ය.
(3) සුභද්‍ර තෙරුන් ය. (4) ආනන්ද තෙරුන් ය.

03. බුදුරජාණන් වහන්සේ අවසන් වස් කාලය ගත කළ ස්ථානය වන්නේ,
(1) බේලුව ගමේ ය. (2) කුසිනාරා නුවර ය.
(3) රජගහ නුවර ය. (4) සැවැත් නුවර ය.

04. අප විසින් වචනයෙන් සිදු කරනු ලබන (වචී කම්ම) වැරදි සංඛ්‍යාව,
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි.

05. බුදුරජාණන් වහන්සේගේ ඌර්ණරෝම ධාතූන් වහන්සේ තැන්පත් කොට ඉදිකළ ස්තූපය කුමක් ද?
(1) මිහින්තලේ සේල චෛත්‍යය යි. (2) කතරගම කිරිවෙහෙර යි.
(3) බදුල්ල මුතියංගන චෛත්‍යය යි. (4) අනුරාධපුර ථූපාරාම චෛත්‍යය යි.

06. භික්ෂුණී ශාසනයට ප්‍රථම ආරාම පූජාව සිදු කළේ,
(1) මල්ල රජදරුවන් ය. (2) ශාක්‍ය රජදරුවන් ය.
(3) ලිච්ඡවී රජවරුන් ය. (4) කෝලිය රජවරුන් ය.

07. සමාධිමත් බව හා නිවන් මග සංකේතවත් කරන බෞද්ධ පූජනීය සංකේතය වන්නේ,
(1) බෝධීන් වහන්සේ ය. (2) ප්‍රතිමා වහන්සේ ය.
(3) පිරුවානා පොත් වහන්සේ ය. (4) දාගැබ් වහන්සේ ය.

08. ඕනෑම සමාජයක යහපැවැත්ම උදෙසා සමාජයේ ජීවත්වන සැවොම තම තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කළ යුතු ආකාරය සඳහන් වන සූත්‍රය වන්නේ,
(1) මහා මංගල සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) දම්සක් පැවතුම් සූත්‍රයයි. (4) කරණීයමෙත්ත සූත්‍රයයි.

09. පෙර භවයක දී තම දෙමවුපියන් කැලයට ගෙන ගොස් පහර දී ඝාතනය කළ නිසා අවසන් භවයේ දී සොරුන්ගෙන් පහර කා පිරිනිවන් පා වදාළ රහතන් වහන්සේ වන්නේ,

(1) අනුරුද්ධ රහතන් වහන්සේ ය.
(2) රාහුල රහතන් වහන්සේ ය.
(3) සැරියුත් රහතන් වහන්සේ ය.
(4) මුගලන් රහතන් වහන්සේ ය.

10. සම්මා කම්මන්ත යටතේ විස්තර වන නිවැරදි ක්‍රියා වන්නේ,

(1) සිතින් කරන යහපත් ක්‍රියාවන් ය.
(2) කයින් කරන යහපත් ක්‍රියාවන් ය.
(3) වචනයෙන් කරන යහපත් ක්‍රියාවන් ය.
(4) තිදොරින් ම කරන යහපත් ක්‍රියාවන් ය.

11. බුදුරජාණන් වහන්සේ යසෝදරා දේවියගේ ගුණ වර්ණනා කරමින් සුද්ධෝදන රජමාලිගාවේ දී දේශනා කළ ජාතක කතාව වන්නේ,

(1) මහා ධර්මපාල ජාතකයයි.
(2) සාම ජාතකයයි.
(3) වෙස්සන්තර ජාතකයයි.
(4) සඳකිඳුරු ජාතකයයි.

12. අන් අයගේ දියුණුව දැක එය තමාගේ දියුණුවක් සේ සලකා සතුටු වීමේ ගුණය සිවු බඹ විහරණවල දැක්වෙන්නේ,

(1) මෙත්තා යනුවෙනි.
(2) කරුණා යනුවෙනි.
(3) මුදිතා යනුවෙනි.
(4) උපෙක්ඛා යනුවෙනි.

13. පුද්ගලයෙකු විසින් රැස්කර ගත යුතු අධ්‍යාත්මික ධන හතකි. එහි පළමු ධනය කුමක් ද?

(1) ශ්‍රද්ධා ධනයයි.
(2) සීල ධනයයි.
(3) චාග ධනයයි.
(4) සුත ධනයයි.

14. "මුනිඳු දෙසූ විලසින - මහඟු පිළිවෙත් සුරකින
අරිය අට සඟ ගණ - ......................................" මෙහි හිස්තැනට සුදුසු කවි පදය කුමක් ද?

(1) ආහුණෙය්‍යයි අරිය සඟ ගණ
(2) දක්ඛිණෙය්‍යයි කියා පැවැසිණ
(3) සුපටිපන්නය කියා පැවැසිණ
(4) අනුත්තර පින් කෙතය සඟ ගණ

15. බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් කුලයේ ම අයට බුදු සසුනේ පැවිදි වීමට ලැබීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) කාරුණික ගුණයයි.
(2) සමානාත්මතා ගුණයයි.
(3) සහනශීලී පිළිවෙතයි.
(4) නම්‍යශීලී බවයි.

16. බුදු දහමේ ඉගැන්වෙන "සතර අගති" ලෙස සැලකෙන්නේ මේ අතරින් කුමක් ද?

(1) දානය, ශීලය, නෙක්ඛම්ම, ප්‍රඥාව
(2) මෙත්තා, කරුණා, මුදිතා උපේක්‍ෂා
(3) ජාති, ජරා, ව්‍යාධි, මරණ
(4) ඡන්දය, ද්වේශය, භය, මෝහය

17. දෙවන ධර්ම සංගායනාව පවත්වා ඇත්තේ සම්බුද්ධ පරිනිර්වාණය සිදු වී,

(1) වසර 236කට පසුව ය.
(2) වසර 218කට පසුව ය.
(3) වසර 100කට පසුව ය.
(4) මාස 03කට පසුව ය.

18. ධර්මප්‍රදීපිකාව හෙවත් මහා බෝධිවංශ පරිකථාව නම් කෘතිය ලියැවී ඇත්තේ,

(1) පොළොන්නරු යුගයේ දී ය.
(2) දඹදෙණි යුගයේ දී ය.
(3) කුරුණෑගල යුගයේ දී ය.
(4) ගම්පොළ යුගයේ දී ය.

19. දීඝිති කෝසල ජාතකයේ දී දීඝායු කුමාරයාට "ළඟ නොබලන්න, දුර බලන්න" යනුවෙන් පිය රජතුමා දුන් උපදේශයෙන් පැහැදිලි වන්නේ,

(1) ළඟ නොබැලීමේ වැදගත්කම යි.
(2) ඉවසීමේ හා බුද්ධිමත් බවේ වැදගත්කම යි.
(3) දුර ගමන් යෑමේ වැදගත්කම යි.
(4) තමන් ගැන බැලීමේ වැදගත්කම යි.

20. අපිරිසිදු ජලය පිරිසිදු කිරීමට හැකි මැණිකක් මෙන්, පිරිසිදු සිතෙහි තෙරුවන් ගුණ පිළිබඳ ඇතිවන ශ්‍රද්ධාව,

(1) සම්පසාදන ලක්ඛණ ශ්‍රද්ධා නම් වේ.
(2) සම්පක්කන්ධන ලක්ඛණ ශ්‍රද්ධා නම් වේ.
(3) සද්දහන ශ්‍රද්ධා නම් වේ.
(4) ඔක්කප්පන ශ්‍රද්ධා නම් වේ.

## II කොටස

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- 02 වන ප්‍රශ්නයේ සිට 07 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න 04ක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01. තෙවන වාරයේ බුද්ධ ධර්මය විෂයට සමගාමී ව පාසල් පාදක තක්සේරුව සඳහා ඔබ විසින් සිදුකරන ලද ඇගයීම ඇසුරින් පළමු ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

i. ඔබ විසින් සිදුකරනු ලැබූ ඇගයීම් ප්‍රභේදය නම් කරන්න.
ii. එම ඇගයීම් ප්‍රභේදය සඳහා යොදාගත් පාඩමේ නම කුමක් ද?
iii. මෙම ඇගයීම් ක්‍රියාවලියෙන් පසු ඔබ තුළ ගොඩනැගුණු කුසලතා දෙකක් ලියන්න.
iv. ඇගයීම සිදු කිරීමට ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
v. ඇගයීම සඳහා ඔබ අමතර දැනුම රැස්කර ගත් ආකාර දෙකක් ලියන්න.
vi. බෞද්ධ ස්තූපයක දක්නට ලැබෙන ආකෘති දෙකක් නම් කරන්න.
vii. අනුරාධපුර යුගයට අයත් සමාධි බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න.
viii. පැරණි විහාර මන්දිරවල අඳින ලද සිතුවම් සඳහා බලපෑ මූලාශ්‍ර දෙකක් ලියන්න.
ix. පොළොන්නරු යුගයේ ලියැවුණු සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.
x. මහනුවර යුගයේ ජීවත් වූ ග්‍රන්ථ කතුවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

02. i. "සුකරානි අසාධූනි ....................." යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
ii. එම ගාථාවේ තේරුම ලියන්න.
iii. සත්පුරුෂ අවවාද පිළිගැනීමෙන් හා පිළිපැදීමෙන් ජීවිතයට යහපත ළඟා කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

03. ධර්මධර හා විනයධර මහතෙරවරුන් රැස්ව ශාසන අභිවෘද්ධිය අපේක්ෂාවෙන් බුද්ධ වචනය ඒකරාශි කොට සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ.

i. තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව හා පැවැත් වූ ස්ථානය සඳහන් කරන්න.
ii. එම ධර්ම සංගායනාවෙන් ලැබුණු ප්‍රතිඵල තුනක් ලියන්න.
iii. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබුණු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

04. i. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති" මෙම පාලි පාඨයේ තේරුම ලියන්න.
ii. කුසල චේතනාවන් තුන මොනවා ද?
iii. පව්කම් නොකිරීම මෙලොව හා පරලොව සැපයට හේතුවන අයුරු පෙන්වා දෙන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

05. i. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කළ අවස්ථාවන් දෙකක් සඳහන් කරන්න.
ii. මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.
iii. නිසි නායකත්වය හා කැපවීම තුළින් ඔබේ ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

06. i. යුතුකම් හා වගකීම් පිළිබඳ ව සඳහන් වන සූත්‍රය කුමක් ද? එය දේශනා කළේ කවුරුන් උදෙසා ද?

ii. එම සූත්‍රයෙහි සඳහන් පාලකයන් විසින් සේවකයන්ට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.

iii. පැවිදි උතුමන්ගෙන් සමාජයට ඉටු වන සේවාවන් මොනවා දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. ආකාරවතී ශ්‍රද්ධාව

ii. බලංගොඩ මහානායක හාමුදුරුවෝ

iii. කායික නිරෝගී බව

iv. ආනාපානසති භාවනාව

(ලකුණු 5 + 5 = 10)